# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ඊඩී/9/9/1/15/4/- ii
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2020.09.22

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල් ප්‍රධානීන්,

**<u>ලෝක ළමා දින වැඩසටහන - 2020 ඔක්තෝබර් 01</u>**

සෑම වසරකම ඔක්තෝබර් පළමුවන දිනට යෙදෙන ලෝක ළමා දිනය වෙනුවෙන් විශේෂ තේමාවක් ඔස්සේ සියලු ම පාසල්වල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මෙම වර්ෂයේ ලෝක ළමා දින තේමාව ලෙස **<u>" අපේ රට අපේ දෑතින් "</u>** යන්න කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇත.

02. මෙම වර්ෂයේ ලෝක ළමා දිනය යෙදෙන ඔක්තෝබර් මස 01 දින රජයේ නිවාඩු දිනයක් බැවින් හා කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද තවදුරටත් අනුගමනය කළ යුතු බැවින්, ඔක්තෝබර් 02 සහ 05 යන දිනවල දී පමණක් සෑම පාසලකම ලෝක ළමා දිනයට සමගාමීව මෙම තේමාවට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

03. දරුවන්ට සෙනෙහස සපිරි සුන්දර ළමා ලෝකයක් නිර්මාණය කිරීම මෙන්ම සිසුන් ස්වයං ඉගෙනුමට, නිරීක්ෂණයට හා ගවේෂණයට යොමු කරමින් නිර්මාණශීලී හැකියාවන්ගෙන් පිරිපුන් දරුවන් බිහි කිරීම සඳහා නිසි මග පෙන්වීම හා අවස්ථා සම්පාදනය තුළින් ඔවුන් ධෛර්යමත් කිරීම, ගුරු දෙගුරු සියලු දෙනාගේ වගකීමයි. එසේම වර්තමානයේ දරුවන් මුහුණ දෙන අභියෝගයන් පිළිබඳව අවධානය යොමු කිරීම ද වැදගත්ය. මෙම කරුණුවලට මූලිකත්වය දෙමින් පහත වැඩසටහන්වලින් තෝරාගත් වැඩසටහන් පාසලට උචිත පරිදි ක්‍රියාත්මක කළ හැකිය.

(අ) ලෝක ළමා දින තේමා පාඨය ඇතුළත් බැනරය පාසල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම.

(ආ) දරුවන්ගේ විවිධත්වයට ගරු කරමින් ඔවුන්ගේ විභව්‍යතාවයන් උපරිම ලෙස සංවර්ධනය කිරීම සඳහා ගුරු දෙගුරු වැඩිහිටි කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පාසල් මට්ටමින් සුදුසු සම්පත්දායකයින් මගින් ක්‍රියාත්මක කිරීම.

(ඇ) වර්තමානයේ දරුවන් මුහුණ දෙන අභියෝග අතර ප්‍රමුඛත්වය ගන්නා කොරෝනා වෛරස් තත්ත්වයෙන් ආරක්ෂාවීම පිළිබඳ සිසුන් දැනුවත් කිරීම සමාජ වගකීමකි. එබැවින් සෞඛ්‍යාරක්ෂිත පියවර සම්බන්ධයෙන් සිසු දැනුවත් කිරීම් හා අවශ්‍ය නිපුණතා සංවර්ධන වැඩසටහන් සිසුන් සඳහා ක්‍රියාත්මක කිරීම.

(ඈ) මෙම වර්ෂයේ ලෝක ළමා දින තේමාවට අදාළව මාතෘකා තෝරාගනිමින් ළමයින්ගේ නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක කුසලතා ඔප් නැංවෙන පරිදි කෙටි නාට්‍ය, ගායන, වාදන, නර්තන අංගයන් ඉදිරිපත් කිරීමට යොමු කිරීම.

(ඉ) ඔක්තෝබර් මස 02 වන දින උදෑසන රැස්වීමේ දී <u>" අපේ රට අපේ දෑතින් "</u> තේමාවට අදාළව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඊ) පාසල් බිත්ති පුවත්පත්වල මෙම තේමාවට අදාළව නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට සිසුන් දිරිමත් කිරීම.

(උ) පාසල් දරුවන් මත් උවදුරෙන් බේරාගැනීම සඳහා දෙමාපියන්ගේ කාර්ය භාරය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම.

(ඌ) පාසල් සිසුන්ගේ සෞඛ්‍යයට හිතකර දේශීය ආහාර වර්ග භාවිතය ප්‍රවර්ධනය සහ අධික ලුණු, සීනි, තෙල් සහ කෘත්‍රිම වර්ණක හා රසකාරක අඩංගු සෞඛ්‍යයට අහිතකර ආහාරවලින් වැළකීම පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම.

ලෝක ළමා දින තේමාව පදනම් කරගෙන ඉහත කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ඵලදායී වැඩසටහන් සෑම පාසලකම ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය